සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

**8 ශ්‍රේණිය** | **තෙවන වාර පරීක්ෂණය - 2024** | **61 S I,II**

නම: .............................................

# භූගෝල විද්‍යාව

කාලය පැය දෙකයි

- ★ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- ★ **ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01) පෘථිවිය සහ සූර්යයා අතර දුර ප්‍රමාණය කිලෝමීටර් මිලියන ................................ පමණ වේ.
( 510 / 150 / 6000 )

02) සෞරග්‍රහ මණ්ඩලයේ මතුපිට උෂ්ණත්වය -200˚C පමණ වන්නේ ......................... ග්‍රහලෝකයේ ය.
(යුරේනස් / සෙනසුරු / නෙප්චූන් )

03) ක්‍රිස්තු වර්ෂ 2006 දී අන්තර්ජාතික තාරකා විද්‍යා සංගමය විසින් .................................... වාමන ග්‍රහයෙකු ලෙස නම් කර ඇත.
(සෙරිස් / එරිස් / ප්ලූටෝ )

04) හැඩපලුගංගා, ගංදගර, පිටාර තැනි වැනි භූ රූප ...................................... භූ දර්ශනය තුළ දැකගත හැකිය.
(ගංගා නිම්න / කඳුකර / වෙරළ )

05) දකුණු ආසියාතික කලාපයේ පවතින්නේ ..................................... දේශගුණයයි.
(මෝසම් / නිවර්තන / සෞම්‍ය )

★ **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් (✔) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06) පෘථිවිය උතුරු හා දකුණු අර්ධගෝල ලෙස දෙකකට බෙදෙන කල්පිත රේඛාව සමකය වේ. (............)

07) ශ්‍රී ලංකාවේ වියළි කලාපය රැළිබිම් සහිත තැනිතලාවකි. (............)

08) සෙනසුරු ග්‍රහයාට අයත් උප ග්‍රහයින් ගණන 67 කි. (............)

09) මුළු පෘථිවි තලයෙන් 3/4 ක් පමණම සාගර හා මුහුදු ජලයෙන් වැසී ඇත. (............)

10) මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් වායුගෝලයේ කාබන්ඩයොක්සයිඩ් ප්‍රතිශතය ඉහළ යමින් පවතී (............)

★ **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය යොදා සම්පූර්ණ කරන්න.**

11) සූර්යයා වටා කක්ෂතල ඔස්සේ ගමන් කරන ගෝලාකාර වස්තූන් .............................. ලෙස හැඳින්වේ.

12) හින්දු බැතිමතුන් සමරන තෛපොංගල් උත්සවය ............................ පදනම් කරගත් උත්සවයකි.

13) පෘථිවියේ ................................. ශක්තිය මගින් වායුගෝලය පෘථිවිතලය හා බැඳී පවතී.

14) ශ්‍රී ලංකාව අයත් වන වේලා කලාපය ......................... වේලා කලාපය වේ.

15) ශ්‍රී ලංකාවේ 1 : 50,000 භූ ලක්ෂණ සිතියම් වල භූ ලක්ෂණ දැක්වීම සඳහා .............................. යොදාගෙන ඇත.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

★ **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

16) ● පාෂාණමය සංයුතියක් සහිත වේ.
  ● සිලිකේට් හා ලෝහමය ද්‍රව්‍ය වලින් සකස් වී ඇත.
  ඉහත දැක්වෙන ප්‍රකාශ වලින් කියැවනුයේ සෞරග්‍රහ මණ්ඩලයේ කුමන අභ්‍යවකාශ වස්තුව ද ?

1. බාහිර ග්‍රහලෝක  2. අභ්‍යන්තර ග්‍රහලෝක
2. වාමන ග්‍රහලෝක  4. උප ග්‍රහලෝක

17) පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් බ්‍රහස්පති ග්‍රහයා සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ දෙකක් දැක්වෙන පිළිතුර තෝරන්න.

A - ගුරුත්වාකර්ෂණ බලය අධිකයි.
B - සෞරග්‍රහ මණ්ඩලයේ විශාලතම ග්‍රහලෝකය වේ.
C - නැගෙනහිර සිට බටහිර දෙසට භ්‍රමණය වේ.
D - දර්ශනිය වළලු පද්ධතියක් පිහිටා ඇත.

1. A හා C  2. B හා C  3. A හා B  4. C හා D

18) වෙරළබඩ භූ දර්ශනය තුළ ජෛව විවිධත්වය ඉහළ මට්ටමක පවතින පරිසර පද්ධතියක් වන්නේ කුමක් ද?
1. මිරිදිය වගුරු  2. මිරිදිය ජලාශ  3. ගංගා  4. කඩොලාන


19) ශ්‍රී ලංකාවේ ග්‍රාමීය භූ දර්ශනයේ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් දෙකක් දැක්වෙන පිළිතුර කුමක් ද?
1. ධීවර කර්මාන්තය හා වන කර්මාන්තය
2. කෘෂි කර්මාන්තය හා වන කර්මාන්තය
3. කෘෂි කර්මාන්තය හා ධීවර කර්මාන්තය
4. වතු කෘෂිකර්මය හා වන කර්මාන්තය

20) නේපාලයේ ටෙරායි නිම්නය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. හිම මිදුණු ප්‍රදේශයකි.
2. උණුසුම් දේශගුණික ලක්ෂණ ඇත.
3. ශාක හා සත්ව විශේෂ බහුලයි.
4. සංචාරක කර්මාන්තය ආශ්‍රිත රැකියා සුලභ වේ.

## II කොටස

★ **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
★ **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

01) (අ) මෙම කොටසට පිළිතුර සැපයීම සඳහා පහත දී ඇති සිතියම උපයෝගී කරගන්න.






Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

i. සමෝච්ච රේඛාවල අගයන් දක්වන්න. (ල. 2)


ii. මීටර් 180 ට වඩා ඉහළ ප්‍රදේශ දුඹුරු පාටින් සේයා කරන්න. (ල. 2)

iii. සිතියමේ A- B හා C-D රේඛා වලින් දක්වා ඇති භූ ලක්ෂණ නම් කරන්න. (ල. 2)

iv. සිතියමේ කදුවැටිය හා මීටර් 100 සමෝච්ච රේඛාව අතරින් A ශ්‍රේණියේ මාර්ගයක් ඇඳ දක්වන්න. (ල. 1)

v. මීටර් 100 සමෝච්ච රේඛාවට ආසන්නව ඊට දකුණු පසින් පළාත් මායිමක් ඇඳ දක්වන්න. (ල. 1)

(ආ) පිළිතුරු සැපයීමේදී පහත දකුණු ආසියාතු කලාපය දැක්වෙන සිතියම උපයෝගි කරගන්න.




i. ඉන්දියාවට අයත් දූපතක් දැක්වෙන අක්ෂරය කුමක් ද?

ii. මධ්‍යම ආසියාවට අයත් දකුණු ආසියාතික සහයෝගිතා සංවිධානයේ සාමාජිකත්වය හිමි රටක් D අක්ෂරයෙන් දැක්වේ. එය නම් කරන්න.

iii. E අක්ෂරයෙන් දැක්වෙන කදුවැටිය නම් කරන්න.

iv. භූටියා, කසා වැනි ගෝත්‍රික ජන වර්ග වාසය කරන කදුවැටිය දැක්වෙන අක්ෂරය කුමක් ද?

v. හින්දු බැතිමතුන්ගේ ශුද්ධ වූ නදිය දැක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද?

vi. දකුණු ආසියාවේ ප්‍රසිද්ධ වගුරුබිමක් පිහිටි රටෙහි අක්ෂරය කුමක් ද?

vii. ක්ෂෙමභූමි ප්‍රදේශයක් දැකගත හැක්කේ කුමන අක්ෂරයන් සහිත ප්‍රදේශයේ ද?

viii. N අක්ෂරයෙන් දැක්වෙන තුඩුව නම් කරන්න. (ල. 1x1=8)

02) i. ග්‍රහලෝක සහ තාරකා අතර වෙනස්කම් දෙකක් ලියන්න. (ල. 2)

ii. a). ප්‍රධාන ග්‍රහලෝක වලට අයත් උපග්‍රහයින් ගණන කීයද?

b). පෘථිවි ග්‍රහයාට අයත් උපග්‍රහයෙකු නම් කරන්න.

c). උප ග්‍රහයින්ගේ විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 4)

iii. a). සෞරග්‍රහ මණ්ඩලයේ ප්‍රධානියා නම් කරන්න.

b). සෞරග්‍රහ මණ්ඩලයේ ප්‍රධානියාගේ විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 5)

03) i. පෘථිවිය පිළිබඳ මූලික තොරතුරු කිහිපයක් පහත දැක්වේ. එහි A හා B හිස්තැන් වලට අදාල පිළිතුර පිළිවෙලින් ලියන්න. (ල.2)

| භ්‍රමණ කාලය | භ්‍රමණ වේගය සමකයේ දී | පරිභ්‍රමණ කාලය | පරිභ්‍රමණ වේගය |
|---|---|---|---|
| A ............ | තත්පරයට කිලෝමීටර් 0.46 | දින 365 පැය 06 | B ............ |

ii. පෘථිවිය ජීවීන්ගේ වාස භූමියක් බවට පත්වීමට බලපෑ ඇති හේතු 02 ක් ලියන්න. (ල.4)

iii. a). පෘථිවි භ්‍රමණය යනු කුමක්දැයි හඳුන්වන්න.

b). පහත දැක්වෙන අක්ෂාංශ රේඛා හඳුන්වන නම් ලියන්න.

i. දකුණු අක්ෂාංශ 23 1/2°

ii. උතුරු අක්ෂාංශ 66 1/2°

c). ග්‍රිනිච් මධ්‍යහන රේඛාවේ වේලාව පෙ.ව. 8.30 ලෙස සලකා පහත දැක්වෙන දේශාංශ වල වේලාව ගණනය කරන්න.

i. නැගෙනහිර දේශාංශ 82°

ii. බටහිර දේශාංශ 35° (ල.5)



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

04) i. පෘථිවිය පරිභ්‍රමණය නිසා මාර්තු 21 සහ දෙසැම්බර් 22 හිරු මුදුන්වීම හඳුන්වන නම් පිළිවෙලින් ලියන්න. (ල. 2)

ii. a). පහත A, B හා C රූප සටහන් වලින් දැක්වෙන සෘතු හැඳිනගෙන පිළිවෙළින් නම් කරන්න. (ල. 3)

A



B



C



iii. a). ඔබ ඉහත දැක් වූ A රූපයෙහි දැක්වෙන සෘතුවේ විශේෂ දේශගුණික ලක්ෂණ දෙකක් ලියන්න.

b). ජලය දූෂණය වීමට හේතුවන මානුෂ ක්‍රියාකාරකම් දෙකක් ලියන්න.

c). වායුගෝලය දූෂණයට ලක්වීම නිසා මිනිසාට අත්විඳීමට සිදුවන අහිතකර ප්‍රතිඵල 02 ක් ලියන්න. (ල. 6)

05) i. දකුණු ආසියානු කලාපයේ නිරපේක්ෂ පිහිටීම ලියන්න. (ල.2)

ii. දකුණු ආසියානු කලාපය පිළිබඳ දැනුම ඇසුරින් පිළිතුරු සපයන්න. (ල.3)

a). ලෝකයේ ඉහළම උන්නතාංශයක් දක්වන ස්ථානය

b). භූතානයේ අගනුවර

c). දකුණු ආසියාවේ නැගෙනහිර සීමාව


iii. a). දකුණු ආසියාවේ වැඩිම ජන සංඛ්‍යාවක් හා අඩුම ජන සංඛ්‍යාවක් වාසය කරන රටවල් දෙක පිළිවෙලින් නම් කරන්න.

b). දකුණු ආසියාවට අයත් දූපත් රාජ්‍ය 02 ක් ලියන්න.

c). දකුණු ආසියාතික කලාපය සුවිශේෂි භූගෝලීය කලාපයක් වීමට බලපා ඇති හේතු 02 ක් ලියන්න. (ල.6)

06) i. වෙරළබඩ භූ දර්ශනයේ කැපී පෙනෙන භෞතික ලක්ෂණ 02 ක් ලියන්න. (ල.2)

ii. රූප සටහනේ ධීවර කර්මාන්තය ආශ්‍රිත මානුෂ ක්‍රියාකාරකම් දැක්වේ. එහි A, B හා C වලට අයත් පිළිතුර ලියන්න. (ල.3)






Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

iii. a. මාලදිවයින් රාජ්‍යයේ සංචාරක කර්මාන්තයේ වර්ධනයට බලපා ඇති හේතු සාධක 02 ක් ලියන්න.

b. ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය දියුණු වීම නිසා ඒ ප්‍රදේශ ආශ්‍රිතව බිහි වී ඇති රැකියා අවස්ථා 02 ක් ලියන්න.


c. වෙරළ භූ දර්ශනය ආරක්ෂා කරගැනීමට ඔබට කල හැකි ක්‍රියාකාරකම් දෙකක් ලියන්න. (ල. 6)

07) i. දකුණු ආසියානු කලාපයේ දක්නට ලැබෙන භූ දර්ශන දෙකෙන් A හා B රූප වලින් දැක්වේ. ඒවා නම් කරන්න. (ල. 2)

A



B



ii. a). A භූ දර්ශනය දක්නට ලැබෙන දකුණු ආසියාවේ ප්‍රදේශයක් නම් කරන්න.

b). එම භූ දර්ශනය තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 3)

iii. a). B භූ දර්ශනයේ විශේෂ ලක්ෂණ 02 ක් ලියන්න.


b). B භූ දර්ශනය දක්නට ලැබෙන දකුණු ආසියාවේ ප්‍රදේශ දෙකක් ලියන්න.

c). B භූ දර්ශනය ආශ්‍රිතව පැන නැගී ඇති ගැටළු දෙකක් ලියන්න. (ල. 6)


8) i. සිතියම් වල දක්නට ලැබෙන භෞතික ලක්ෂණයක් හා සංස්කෘතික ලක්ෂණයක් ලියන්න. (ල. 2)

ii. පහත A B හා C වලින් දැක්වෙන භූ ලක්ෂණ හැඳිනගෙන නම් කරන්න. (ල. 3)


A




B



C




iii. a). සමෝච්ච රේඛාවල විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න.

b). 1 : 50,000 භූ ලක්ෂණ සිතියම් වල දැක්වෙන පහත සංස්කෘතික ලක්ෂණ හැඳිනගෙන නම් කරන්න.

 (රතු වර්ණය)  (රතු වර්ණය)

c). පහත දැක්වෙන ලක්ෂණ 1 : 50,000 භූ ලක්ෂණ සිතියම් වල නිරූපණය කරන ආකාරය ඇඳ දක්වන්න.

i. දුම්රිය මාර්ගය හා දුම්රිය නැවතුම

ii. වැව හා වාරි මාර්ගය (ල.6)



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## භූගෝල විද්‍යාව - 8 ශ්‍රේණිය
## පිළිතුරු

### II කොටස

| | | | | |
|---|---|---|---|---|
| 1) 150 | 2) නෙප්චූන් | 3) ප්ලූටෝ | 4) ගංගා නිම්නය | 5) නිවර්තන |
| 6) ✔ | 7) ✔ | 8) x | 9) x | 10) ✔ |
| 11) ග්‍රහලෝක 12) හිරු සඳු | 13) ගුරුත්වාකර්ෂණ | | 14) මදුරාසි | 15) සමෝච්චරේඛා |
| 16) 2 | 17) 3 | 18) 4 | 19) 2 | 20) 1 |

### I කොටස

01. (අ) i. 140 සිට සමෝච්ච රේඛාවල අගය 20m න් 20m ට දක්වා තිබීමට ලකුණු 2 යි.

ii. 180m ට ඉහළ ප්‍රදේශ තුනක් ඇත. දුඹුරු පාටින් සේයා කර තිබීමට ලකුණු 2 යි.

iii. AB - නිම්නය, CD - කපොල්ල

iv. කඳුවැටිය හා මීටර් 100 සමෝච රේඛාව අතරින් නිවැරදි මාර්ගයක් ඇඳ තිබිය යුතුය. (ල.01)

v. මීටර් 100 ට දකුණින් +-+-+-+ ලෙස පලාත් මායිමක් ඇඳ තිබිය යුතුයි. (ල.01)

(ආ) i. B   ii. ඇෆ්ගනිස්ථානය   iii. සුලෙයිමන් වැටි   iv. C F

v. J   vi. M   vii. Q   viii. හොමරින් තුඩුව

(ල. 1x8=8)

02) i.

| තාරකා | ග්‍රහලෝක |
|---|---|
| ආලෝකය හා තාපය නිකුත් කරයි. | ආලෝකය නිකුත් නොකරයි. |
| දිදුලන ස්වභාවයෙන් යුක්තයි. (බැබළෙයි) | සූර්යයාගෙන් ලැබෙන ආලෝකය පරාවර්තනය කරයි. බැබලීමක් නොමැතිව ඒකාකාරී ආලෝකයක් සහිතව දර්ශනය වේ. |

වෙනස්කම් දෙකක් ලියා ඇත්නම් ලකුණු 02 කි.

ii. a. 173 (ල.01)

b. චන්ද්‍රයා (ල.01)

c. ග්‍රහලෝක වටා කක්ෂගතව පරිභ්‍රමණය වේ. කුඩා පරිවාර ග්‍රහලෝක (ග්‍රහලෝක වලට වඩා ප්‍රමාණයෙන් කුඩාය) (ල.02)

iii. a. සූර්යයා (ල.01)

b. සූර්යයාගේ මධ්‍යයේ උෂ්ණත්වය 150,00000 පමණ වේ./මතුපිට උෂ්ණත්වය 6000˚C ක් පමණ වේ. විෂ්කම්භය කි.මී. මිලියන 1.4 ක් පමණ වේ./ සෞරග්‍රහ මණ්ඩලයේ මූලස්ථානය හෙවත් සමස්ත මණ්ඩලයට අයත් ද්‍රව්‍ය වලින් 99.86% ක් ම අයත් ය./ශක්ති ප්‍රභවයක් වේ. සෞරග්‍රහ මණ්ඩලයේ සියළුම ග්‍රහලෝක වලට ශක්තිය හා තාපය ලබාදෙයි./සූර්යයා මතුපිට කුණාටු ඇති වේ. භ්‍රමණය වේ. කාලය පෘථිවි දින 25.4 කි.

මෙවැනි ලක්ෂණ දෙකකට (ල.04)

03) i. A - පැය 23 විනාඩි 56   B - තත්පරයට කිලෝමීටර් 29.8 (ල.02)

ii. ජීවීන්ට හිතකර වායුන්ගෙන් සමන්විත මෙන්ම ජලවාෂ්ප සහිත වායුගෝලයක් පැවතීම. ජලය පැවතීම./මධ්‍යස්ථ උෂ්ණත්වයක් පැවතීම./භ්‍රමණය හා පරිභ්‍රමණය සිදුවීම. ගුරුත්වාකර්ෂණ බලය පැවතීම. මෙවැනි කරුණු 02 කට ලකුණු 02 යි.

iii. a. පෘථිවිය තම අක්ෂය වටා කැරකීම. (ල.01)

b. i. මකර නිවර්තනය   ii. ආක්ටික් වෘත්තය

c. i. ප.ව. 2.38   ii. පෙ.ව. 6.10 (ල.02)

04) i. මාර්තු 21 - වසන්ත සෘතුව/ දෙසැම්බර් 22 - සිසිර නිවෘත්තිය (ල.02)

ii. A - වසන්ත සෘතුව   B - සීත / සිසිර   C - සරත් සෘතුව (ල.02)

iii. a. වසන්ත සෘතුව
- හිම හා අයිස් ක්‍රමයෙන් දියවෙයි.
- අක්‍රියව පැවති ශාක නැවත දළුලා වැඩෙයි.
- මල් හා ඵල හටගැනීම ආරම්භ වේ.

b. කර්මාන්තශාලා වල අපද්‍රව්‍ය දැමීම./ප්‍රවාහනයේ දී තෙල් මුදාහැරීම./ නාගරික අපද්‍රව්‍ය දැමීම. / කැලිකසල දැමීම./ සත්ව පාලනයේ දී අපද්‍රව්‍ය එකතු වීම./න්‍යෂ්ටික අත්හදා බැලීම් වැනි කරුණු 2 කට ලකුණු 2 යි.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

c. ඕසෝන් ස්ථරයට හානි පැමිණීම./ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම./හිමකඳු දියවීම.
අයහපත් දේශගුණ ලක්ෂණ ඇති වීම./ වර්ෂාපතන රටාව වෙනස්වීම./
සුළං රටාව වෙනස් වීම. වැනි කරුණු 2 කට ලකුණු 2 යි.

05) i. සමකයේ (අක්ෂාංශ 0°) සිට උතුරු අක්ෂාංශ 38° දක්වන්න.
නැගෙනහිර දේශාංශ 60° - 100° දක්වා (ල.02)
ii. a. එවරස්ට් කඳු මුදුන b. නිම්න c. බෙංගාල බොක්ක (ල.03)
iii. a. වැඩිම - ඉන්දියාව අඩුම - මාලදිවයින (ල.02)
b. නිකොබාර්, අන්දමන් (ල.02)
c. අධික සීතල ප්‍රදේශ මෙන්ම උෂ්ණ ප්‍රදේශ ද පැවතීම.
ඉහලම උන්නතාංශය දක්වන ප්‍රදේශ මෙන්ම සුන්දරබාන් වැනි වගුරු බිම් තිබීම.
ඝන වනාන්තර මෙන්ම තෘණ භූමි පැවතීම. වැනි විශේෂ කරුණු 2 කට ලකුණු 2 යි.

06) i. වැලිසර, කලපු, බොකු, තුඩු, කොරල්පර, කඩොලාන (ල.02)
ii. a. උම්බලකඩ සෑදීම b. සිප්පි කටු විසිතුරු භාණ්ඩ c. මාළු වින් කිරිම (ල.03)
iii. a. රක්ෂිත කලපු හුදකලා දූපත් වලින් සැදුම්ලත් ස්වභාවික වරාය/කොරල්පර සහිත නොගැඹුරු මුහුද
වෙරළ ආශ්‍රිතව පවතින ජෛව විවිධත්වය/දර්ශනීය සුදු වැලිතලා සහිත වෙරළ
පැහැදිලි ජලය/සංචාරක ආකාර්ෂණය ඇතිවන අයුරින් සකස් කල හෝටල් පහසුකම්
හිරු එළිය විදගත හැකි ස්ථාන බහුල වීම (ල.02)
b. හෝටල් ආශ්‍රිත රැකියා/විසිතුරු භාණ්ඩ අලෙවිය/සංචාරක මඟ පෙන්වන්නන්/වෙළඳාම
ආයුර්වේද මධ්‍යස්ථාන/වරාය ආශ්‍රිත රැකියා (ල.02)
c. වෙරළ දූෂණය නොකිරීම. /වෙරළ පරිසරය ආරක්ෂා කරගැනීමට ජනතාව දැනුවත් කිරීම.
චිත්‍ර ප්‍රදර්ශනය කිරීම වැනි ක්‍රියාමාර්ග දෙකකට ලකුණු දෙන්න.

07) i. A - කාන්තාර භූදර්ශන B - කාර්මික හා නාගරික භූ දර්ශනය (ල.02)
ii. a. A - ථාර් කාන්තාරය
b. වැලිතලා සහිත පැතිරුණු භූමිය/250mm අඩු වර්ෂාපතනය/ අධික වාෂ්පීකරණය
අධික උෂ්ණත්වය/වේගවත් සුළංධාරා කරුණු 2 කට ලකුණු 2 යි
iii. a. මුම්බායි, දිල්ලිය, චෙන්නායි, කල්කටා,කරච්චි, කොළඹ, ඉස්ලාමාබාද් , ඩකා, වැනි නගරයන් (ල.02)
b. සීමිත භූමි ප්‍රමාණයක අධික ජන සංඛ්‍යාවක් සිටීම./කාර්මික හා සේවා කටයුතු වර්ධනය වී තිබීම.
නිවාස ඝණත්වය අධිකයි. (සිරස්ව වර්ධනය වී ඇත)/තට්ටු නිවාස සංකීර්ණ බහුලයි./වීදි ජනයා
බහුලයි./පැල්පත් හා මුඩුක්කු බහුලයි. (අඩු පහසුකම් සහිත නිවාස)
දෛනික සංචලතාව අධිකයි. වැනි ඕනෑම කරුණු 2 කට ලකුණු 2 යි

c. ඉඩම් හිඟය/ වීදි ජනයා බහුල වීම
මාර්ග තදබදය පරිසර දූෂණය
අඩු ආදායම් ජනාවාස බහුල වීම අපචාර බහුල වීම
කැලිකසල එකතු වීම සෞඛ්‍ය ගැටළු (බෝ නොවන රෝග
මෙන්ම බෝ වන රෝග බහුල වීම)
වැනි කරුණු 2 ට ලකුණු 2 යි

08) i. <u>භෞතික</u>
ගංගා
වනාන්තර
කඳුවැටි
නිම්න, තෙරු
කපොලු
බෑවුම්
තැනිතලා
සානු

<u>සංස්කෘතික</u>
වැව්
ගොඩනැගිලි
ජනාවාස
කෘෂි කටයුතු

වැනි ඕනෑම ලක්ෂණ 2 කට ලකුණු 2 යි
ii. A - කොත්මලේ B - කඳුවැටිය C - තෙරුව (ල.03)
iii. a. සෑම සමෝච්ච රේඛාවකටම නිශ්චිත වටිනාකමක් ඇත.
සමෝච්ච රේඛා අන්තරය සමාන වේ. (ල.02)
b. i. පාසල ii. රෝහල
c. i. කළු ඉරි මත රතු පාටින් රවුමක් ඇඳ තිබිය යුතුයි.

+|--|--|--|--|--|o|--|--|--|--+

ii. (වැව් බැම්බ ගුරු පාටින් ඇඳ අනිත් ඒවා නිල්පාටින් ඇඳ වර්ණ ගන්වා තිබිය යුතුයි. නිවැරදි සංකේත හා
වර්ණ භාවිතා කර ඇත්නම් ලකුණු 2 ක් ලබා දෙන්න.)



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com